දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල, )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේ අංකය )FHB/GWH/2018/08
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

දිනය )
திகதி )2018/03/08
Date )

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medicine

පොදු චක්‍ර ලේඛ අංක : 02-33/ 2018

සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

සියළුම ආයතනවල ප්‍රධානීන්

**<u>ස්ත්‍රී ලිංගඡේදනය (FGM) කිරීමෙහි වෛද්‍ය සේවා වෘත්තිකයන් නියැළීම</u>**

FGM යැයි හඳුන්වනු ලබන ස්ත්‍රී ලිංගඡේදනය කිරීම අප්‍රිකා මහාද්වීපයේ ඇතැම් රටවලද, මැදපෙරදිග රටවල් වලද ඇතුළු සමහර ආසියාතික රටවලද දක්නට ලැබෙන සාම්ප්‍රදායික නමුත් හානිකර පුරුද්දකි. ස්ත්‍රී ලිංගේන්ද්‍රිය හිතාමතාම කැපුමකට භාජනය කිරීම හෝ එයට තුවාල සිදුකිරීම මෙයින් අදහස් කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ බහුලව දක්නට නොලැබුනද දිවයිනේ ඇතැම් ප්‍රදේශවල සීමිත කණ්ඩායම් අතර මෙම සිරිත ඇති බව වාර්තා වී ඇත.

ඔබද දන්නා පරිදි මෙම සිරිත සෞඛ්‍යයට හානිකර ප්‍රතිඵල ගෙන දෙන්නකි. පාර්ලිමේන්තුවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ කාන්තාවන් පිළිබඳ ආංශික අධීක්ෂණ කමටුව මෙම සිරිත හානිකර එකක් යැයි වටහා ගෙන මෙය මෙරටින් තුරන් කිරීමට වැඩ පිළිවෙලක් දියත් කර ඇත. මෙහි එක් අංගයක් ලෙසින්, මෙම කමටුව විසින් FGM සිදු කිරීමෙන් වැළකී සිටින මෙන් වෛද්‍ය සේවා වෘත්තිකයන්ට නිර්දේශ කරමින් චක්‍ර ලේඛයක් යවන ලෙසට සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය දැනුවත් කර ඇත.

මේ අනුව මෙම ක්‍රියාවෙන් සිදුවන හානි ගැන පැහැදිලි කරමින් පවුල් සෞඛ්‍ය කාර්යාංශය විසින් ලියවිල්ලක් සම්පාදනය කර ඇති අතර මෙම කරුණ සම්බන්ධව වෛද්‍ය සේවා වෘත්තිකයින් හා වෛද්‍ය නොවන ක්ෂේත්‍රවලට අයත් නිලධාරීන් ( මෙවැනි කරුණු ගැන වගකීම් දරන ) සමඟ පවත්වන ලද රැස්වීමකදී පහත කරුණු ගැන අවධානය යොමු කරන ලද අතර සහභාගී වූවන් සියල්ල එයට සිය ඒකමතික එකඟතාවයද පළ කළහ.

- FGM කුමන මට්ටමකින් සිදු කළද එහි කිසිදු සෞඛ්‍යමය ප්‍රයෝජනයක් නොමැත
- FGM කුමන මට්ටමකින් සිදු කළද ස්ත්‍රීන්ට දිගු කාලීන හා කෙටි කාලීන මානසික / ශාරීරික වේදනාව පමණක් ගෙන දෙන්නකි
- FGM යනු එක් ආකාරයක මානව හිමිකම් උල්ලංඝනයක් වන අතර ළමුන් සඳහා වන ප්‍රඥප්තිය අනුව මෙය 'වධ හිංසාවක්' යැයි නිර්වචනය කළ හැකිය

FGM සිදු කිරීම හෝ එයට අනුබලදීම යනාදී ලෙසින් එය සමග කුමක ආකාරයකින් සම්බන්ධ වුවද එය නුසුදුසු ක්‍රියාවක් ලෙසින්ම සලකනු ලැබේ. තවද 'මිනිස් වර්ගයාට හානි සිදු නොකිරීම' යනු වෛද්‍ය වෘත්තියේ මූලික මූලධර්මයක් වන හෙයින් මෙම ක්‍රියාවෙන් සම්පූර්ණයෙන්ම වැළකී සිටින ලෙස සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියළු වෘත්තිකයන්ට තරයේ උපදෙස් දෙනු ලැබේ. මෙම උපදෙස් නොතකා FGM සිදු කරන හෝ එයට අනුබල දෙන ඕනෑම කෙනෙකුට එරෙහිව විනයානුකූල පියවර ගනු ලැබේ.

.......................................

වෛද්‍ය අනිල් ජාසිංහ

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්:

ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, වෛද්‍ය සේවා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, මහජන සෞඛ්‍ය සේවා
අධ්‍යක්ෂ, මාතෘ සහ ළමා සෞඛ්‍ය, පවුල් සෞඛ්‍ය කාර්යාංශය
අධ්‍යක්ෂ, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, කොළඹ මහනගර සභාව
පළාත් ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ වෛද්‍යවරුන්
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරුන්